# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARIAT - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My Ref. | CSS/03/06/03/04/2022 (06) | ඔබේ අංකය<br>உனது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2021.12.01 |

**<u>ප්‍රමුඛ කාර්යයකි</u>**

ආණ්ඩුකාර ලේකම්, ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය,
ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම අමාත්‍යාංශ ලේකම්වරු / සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**<u>වාර්ෂික ස්ථාන මාරු 2022</u>**
**<u>සම්බන්ධීකරණ නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීම</u>**

දකුණු පළාත් සභාවේ සංවර්ධන නිලධාරී/ කළමනාකරණ සේවා නිලධාරී/ වැඩසටහන් සහකාර/ සංවර්ධන සහකාර/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර/ රියදුරු/ කාර්යාල සේවක සේවය යන සේවාවන්හි නිරත නිලධාරීන් සඳහා 2022 වර්ෂයට අදාළව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව කාරුණිකව දන්වා සිටිමි.

02. ඒ අනුව, <u>වාර්ෂික ස්ථාන මාරු අයදුම් කරන නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර මාර්ගගතව (Online) දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු පිළියෙළ කර ඇති</u> බැවින්, ඒ සඳහා ආයතන මට්ටමින් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ තොරතුරු ලබා ගැනීමට අවශ්‍ය වේ.

03. **එබැවින්, ඉහත සේවාවන්ට අයත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යන ආයතනවල <u>මාණ්ඩලික නිලධාරියෙකු හා පෞද්ගලික ලිපිගොනු / ස්ථාන මාරු විෂය නිලධාරියෙකු සම්බන්ධීකරණ නිලධාරීන් ලෙස නම් කර එම නිලධාරීන්ගේ නම, තනතුර හා ජංගම දුරකථන අංකය 2021.12.06 දිනට පෙර මා වෙත යොමු කරන ලෙස</u>** කාරුණිකව දන්වා සිටිමි.

04. එහිදී, දකුණු පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයීය නිල වෙබ් අඩවියේ ( <u>www.cs.sp.gov.lk</u> ) මුල් පිටුවේ ඇති **"වාර්ෂික ස්ථාන මාරු 2022"** වෙත පිවිස එහි ඇති **"ස්ථාන මාරු සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචි කිරීම"** වෙත පිවිස ඉහත 03 ඡේදයේ දක්වා ඇති තොරතුරු ඇතුළත් කිරීමේ හැකියාව පවතී.

05. එසේම, මේ සම්බන්ධයෙන් **<u>ප්‍රමුඛ කාර්යයක් සේ සලකා ඔබ අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් සියළුම ආයතනවල නිලධාරීන් වෙත ද නොපමාව දැනුම් දීමට කටයුතු කරන ලෙස</u>** වැඩිදුරටත් දන්වමි.

**ආර්.සී. ද සොයිසා**
**ප්‍රධාන ලේකම්**
**දකුණු පළාත.**


| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ප්‍රධාන ලේකම්<br>பிரதான செயலாளர்<br>Chief Secretary | 091 4944002 | කාර්යාලය<br>காரியாலயம்<br>Office | 091 4119011<br>091 2226118 | ෆැක්ස්<br>பெக்ஸ்<br>Fax | 091 2246299 | විද්‍යුත් තැපෑල<br>மின் அஞ்சல்<br>E-mail | chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය<br>இ தளம்<br>Web site | www.cs.sp.gov.lk |

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretariat, S.H. Dahanayaka Mawatha, Galle.
பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


**"සෞභාග්‍යමත් දකුණු පළාතක්"**